සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව දකුණු පළාත් අධ්‍යාපන දෙපා
Department of Education, Southern Province Department of Education, Southern Province Department of Educ

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## තෙවන වාර පරීක්ෂණය - 2020
## Third Term Test - 2020

| 11 ශ්‍රේණිය<br>Grade 11 | ඉස්ලාම් ධර්මය - I | පැය එකයි<br>One hour |
|---|---|---|

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 40 දක්වා ප්‍රශ්න අතරින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

---

01 අකිදා විද්වතුන් මලාඉකාවරුන් ඇතුළත් කරන මාතෘකාව
(1) ඉලාහියියාත් (2) නුබුව්වාත් (3) සම්ඉයියාත් (4) රූහානියියාත්

02 මහා ෂිර්ක් සඳහා නිදසුනකි,
(1) වශී කිරීම (2) අල්ලාහ් හැර නැමදීම
(3) සාස්ත්‍රබැලීම (4) අංජනම් බැලීම

03 හජ් වගකීම්වලින් ''තවාෆුල් ඉෆාළා'' ඉටුකිරීම,
(1) වාජිබ් වේ (2) සුන්නත් වේ (3) ෆර්ල් වේ (4) මුබාහ් වේ

04 මුහම්මද් නබි (සල්) තුමාට පසුව මස්ජිදුල් අක්සාවෙහි ප්‍රථමයෙන් සලාතය ඉටුකරපු කලීෆාවරයා,
(1) උමර් (රලි) (2) අබූබක්කර් (රලි) (3) අලි (රලි) (4) උස්මාන් (රලි)

05 අල්කුර්ආනය ගොනුකිරීමේදී කලීෆාවරුන් වන අබූබක්කර් (රලි), උස්මාන් (රලි) තුමන්ගේ කාල වකවානුවල ප්‍රධානව සහභාගී වූ සහාබිවරයා,
(1) මුආවියා බින් අබි සුෆ්යාන් (රලි) (2) සෛද්බින් සාබිත් (රලි)
(3) හුදෛෆා අල් යමානි (රලි) (4) මුස්අබ් ඉබ්නු උමෛර් (රලි)

06 ශ්‍රී ලංකාවේ ඉස්ලාම් සම්බන්ධව සඳහන් කරන ''අජාඉබුල්හින්ද්'' නම් ග්‍රන්ථයේ කතෘවරයා,
(1) ඉබ්නු ෂහ්රයාර් (2) ඉබ්නුල් අරබි (3) ඉබ්නු හිෂාම් (4) ඉබ්නු කාසිම්

07 ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ උපන් ස්ථානය
(1) බෑඩෑඩ් (2) කූෆා (3) ගාසා (4) මදීනා

08 මදීනා කාලවකවානුවේ නබි (සල්) තුමා විසින් යෙමනයට පත්කළ ආණ්ඩුකාරවරයා,
(1) ජඃෆර් බින් අබි තාලිබ් (රලි) (2) සල්මානුල් ෆාරිස් (රලි)
(3) කාලිද් ඉබ්නු වලිද් (රලි) (4) මුආද් ඉබ්නු ජබල් (රලි)

09 විවාහයකදී ඊජාබ්, කබූල් සඳහා අයිති වන අය,
(1) මනාලයා, මනාලිය (2) වලී, මනාලයා
(3) වලී, ෂාහිද් (4) කාළී, මනාලයා

10 නබි (සල්) තුමාගේ කාලයේ තමන් නබි වශයෙන් වාද කරපු පුද්ගලයා

(1) සජා (2) තුලෛහා (3) අස්වදුල් අන්සි (4) මිර්සා කුලාම්

11 ''බෛතුල්මාල්'' නම් භාණ්ඩාගාරය හඳුන්වා දුන් කලීෆාවරයා,

(1) උමර් (රලි) (2) අබූබක්කර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

12 ඉස්ලාම් අනුමත ව්‍යාපාර ක්‍රමයෙහි හවුල් ව්‍යාපාරය සඳහන් කරන අරාබි පදය

(1) ඉජාරා (2) සලම් (3) රහ්න් (4) මුෂාරකා

13 අල්ලාහ් අනුමත කළ ඔහුට ඉතාමත් පිළිකුල් කරන ක්‍රියාවකි,

(1) බහුබාර්යා විවාහය (2) ණය ලබාගැනීම (3) තලාක් (4) භාරවීම

14 විප්ලවයේ වීරයා ඔරාබි භාෂාවෙහි මව් රට,

(1) මොරොක්කෝව (2) ඊජිප්තුව (3) බැග්ඩෑක් (4) තුර්කිය

15 ජාමිඋත් තිර්මිදියහි ඇතුළත් වූ හදීස් ගණන,

(1) 4800 (2) 4341 (3) 4000 (4) 7275

16 නබි (සල්) තුමා තමන්ගේ දාවා ප්‍රචාරය පවුලේ අය කැඳවා ආරම්භ කළ ස්ථානය,

(1) හිරා ගුහාව (2) සව්ර් ගුහාව (3) අරෆා (4) සෆා කන්ද

17 සකාත් ලැබීමට සුදුස්සන් අතරින් ''ගාරිමූන්'' යනු

(1) ණයකාරයන් (2) දුප්පතුන් (3) මගියා (4) නවක මුස්ලිම්වරු

18 පහත සඳහන් ග්‍රන්ථ අතරින් සිද්ධි ලෙබ්බේ තුමා විසින් රචනා කළ ග්‍රන්ථය

(1) ෆත්හුද්දෛයාත් (2) රූහුල්බයාන් (3) අසන්බේ චරිත් තිරම් (4) ෆත්හුල් මර්න්

19 ''මා දේශපාලන නිදහසට වඩා කිසිම අයිතිවාසිකමක් වැදගත් යැයි සලකන්නේ නැත'' යනුවෙන් ප්‍රකාශ කළ අපේ රටේ විද්වතා

(1) එම්. සි. සිද්ධි ලෙබ්බේ (2) සර් රාසික් ෆරීද්

(3) මාකාන් මරිකාර් (4) ටී. බී. ජායා

20 ලංකාවේ සිට හජ් වන්දනාව සඳහා යන අය නියියත් තැබිය යුතු ස්ථානය

(1) දුල් හුලෛෆා (2) යලම්ලම් (3) අල් ජුහ්ෆා (4) මනායිල්

21 ''කලා කද්ර්'' අවිශ්වාස කර පුද්ගලයාගේ ස්ථාවරය

(1) මුල්හිද් (2) මුර්තද් (3) කාෆිර් (4) මුෂ්රික්

22 ''මා කුස පිරෙන්න ආහාර අනුභව කළහොත් දුප්පතුන්ගේ කුසගින්න අමතක වෙමි යයි බියවෙමි'' යනුවෙන් සඳහන් කළ නබිවරයා

(1) මූසා (අලෛ) (2) යූසුෆ් (අලෛ) (3) ඊසා (අලෛ) (4) යඃකූබ් (අලෛ)

23 කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ පාලනයෙන් පසු ඉස්ලාමීය රාජ්‍ය පාලනය භාරගත් අය

(1) උස්මානියවරු (2) අලවීවරු (3) අබ්බාසියවරු (4) උමෛයාවරු

24 ඉස්ලාමීය වගකීම් අතරින් උම්රාවහි සිදුනොවන එක් ක්‍රියාවකි

(1) තවාෆ් (2) සඃයු (3) හල්ක් (4) අරෆාවෙහි රැඳීම

25 වර්තමාන හිජ්රි වර්ෂය කුමක් ද?

(1) හිජ්රි 1444 (2) හිජ්රි 1442 (3) හිජ්රි 1441 (4) හිජ්රි 1443

26 බිරිඳව නැවත එක්කර ගැනීමට ඉස්ලාම් අනුමත කර ඇති දික්කසාද ක්‍රම

(1) තලාක් බිදර් (2) ෆස්හු (3) තලාක් රජර් (4) තලාක් බාඉන්

27 නබිවරු පාපකර්මවලින් ආරක්ෂා ලැබූ අය යනුවෙන් සඳහන් කරන පදය

(1) ඉස්මත් (2) මුඃජිසාත් (3) කරාමත් (4) මඃරිෆා

28 පහත සඳහන්වන අතර සමීප වූ සමාන වචන යුගලයක්,

(1) ඊමාන් - කුෆ්ර් (2) දුන්යා - ආහිරා

(3) මුජ්තහිද් - මුකල්ලිද් (4) බෛඅතුෂ්ෂජරා - බෛඅතුර් රිල්වාන්

29 මුජ්තහිද්වරු යනු

(1) අල්කුර්ආන් විචාරකයකි (2) හදීස් ක්ෂේත්‍ර විද්වතෙකි

(3) මස්හබ් පිළිපැදිය යුතු අයකි (4) නීති ක්ෂේත්‍ර විද්වතෙකි

30 ඉස්ලාමීය සමාජ විද්‍යා විද්වතුන් අතරින් කෙනෙකි,

(1) රෂීද්රිලා (2) අබුලෛස් (3) අල්ඉද්රිසි (4) අබුබල්දආ

31 පහත සඳහන්වන අරාබි පදයන්හි ''සකාත්'' යන පාඩම සමග සම්බන්ධවන වචනයන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| A | ඉල්ලත් | B | සලම් | C | නියයත් | D | ෆරළ |
| E | නිසාබ් | F | අස්ල් | G | වසකු | H | හව්ල් |

(1) ABCD (2) BCDE (3) ABGH (4) CEGH

32 එළුවන් 100 ක් සතු පුද්ගලයා සකාත් දිය යුතු එළුවන්ගේ ප්‍රමාණය

(1) දෙකයි (2) එකයි (3) තුනයි (4) හතරයි

33 අල්කුර්ආන්හි අවසන් නබි යනු අදහස සඳහන් කරන වචනය,

(1) ෂෆිඋල් මුස්නිබීන් (2) සෙයියදුල් මුර්සලින්

(3) කාතමුන් නබියියින් (4) රහ්මතුල් ලිල් ආලමීන්

34 නබි මුහම්මද් (සල්) තුමාගේ මිඃරාජ් ගමන වන්නේ,

(1) මක්කාවේ සිට මදීනාවට ගිය ගමන වේ.

(2) මක්කාවේ සිට ඇබීසීනියාවට ගිය ගමන වේ.

(3) මක්කාවේ සිට ජෙරුසලමට ගිය ගමන වේ.

(4) මස්ජිදුල් අක්සාව සිට අහස්තලයට ගිය ගමන වේ.

35 පහත සඳහන් වාක්‍යයන්හි නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) මනාලිය විසින් මනාලයාට මහර් ලබාදෙනු ලැබේ.

(2) ''ජාමිඋල් කුර්ආන්'' නම් සුවිශේෂී නම උස්මාන් (රලි) තුමාට අයත්වේ.

(3) කුල්ලතෙන් ජලයට වඩා වැසි ජලය ''අල්මාඋල් කලීල්'' වේ.

(4) ''මහා පව් කරන අය නිරයවාසීන්'' යනු මතය ලැබූ අය මුඃතයිලාවරුන් වේ.

36 ''ෂිර්ක්''' යනු

(1) ආගම් වෙනස් කිරීම

(2) දෙවියෝ නොමැති බව සඳහන් කරන අය

(3) අල්ලාහ්ව නැමදීමට සුදුස්සා වශයෙන් නොපිළිගැනීම

(4) අල්ලාහ්ට සමානව වෙනත් දෙයක් නැමදීමට සුදුස්සා යනුවෙන් සිතීම

37 ජාහිලියියා කාලයේ අරේබියාවේ දක්නට ලැබූ වෙළඳ පොළක්,

(1) දුල්මජාස් (2) කබීලා (3) මුද්ආ (4) මඃදනා

38 කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) තුමාගේ නියෝග අනුව හදීස් එක්රැස් කළ ඉමාම්වරයා,

(1) ඉමාම් සමහ්ෂරි (2) ඉමාම් අබූ ලෛස්

(3) ඉමාම් ෂිහාබුද්දීන් සුහ්රි (4) ඉමාම් කුර්තුබ්

39 කෙනෙකු තමන්ගේ නිවසේ සිට පිටවන විට පාරායනය කරන දුආව,

(1) හස්බියල්ලාහු නිඃමල් බකීල්

(2) බිස්මිල්ලාහි මාෂා අල්ලාහ්

(3) සුබ්හානල්ලාහි වබි හම්දිහි

(4) බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි ලාහව්ල වලා කුව්වත ඉල්ලාබිල්ලාහ්

40 පහත ''අ'' හා ''ආ'' යටතේ දී ඇති තොරතුරු එකිනෙකට සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව ''අ'' තීරුවේ ඇති ඒවා ''ආ'' තීරුවේ ඇති ඒවා සමග අනුපිළිවෙළින් ගළපා ඇති වරණය තෝරන්න.

| ''අ'' | | ''ආ'' |
|---|---|---|
| 1. ඉමාම් ෂාහිර් (රහ්) | A | ෆික්හුල් අක්බර් |
| 2. ඉමාම් අබූහනීෆා (රහ්) | B | අල් උම්මු |
| 3. ඉමාම් මාලික් (රහ්) | C | මුස්නද් |
| 4. ඉමාම් අහ්මද් (රහ්) | D | මුඅත්තා |

(1) ABCD (2) BCDA (3) BADC (4) DCAB

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Department of Education, Southern Province Department of Educ

**තෙවන වාර පරීක්ෂණය - 2020**
**Third Term Test - 2020**

| 11 ශ්‍රේණිය Grade 11 | ඉස්ලාම් ධර්මය - II | පැය දෙකයි Two hours |
|---|---|---|

## I - කොටස

උපදෙස් :
- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) සකාත් හි ෆර්ලයන් දෙක සඳහන් කරන්න.

(ii) කියාමත් දිනය ඇතිවීමට තිබෙන ඉතා වැදගත් මහා ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(iii) ආධ්‍යාත්මික දියුණුවට ඉස්ලාමීය මඟපෙන්වීම් දෙකක් සඳහන් කරන්න.

(iv) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ගුරුවරුන් දෙදෙනෙකු නම් කරන්න.

(v) අරාබිවරු ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල නවාතැන් ගැනීමට හේතු වූ කාරණාවන් දෙකක් සඳහන් කරන්න.

(vi) කලීෆා උස්මාන් (රලි) තුමාගේ කාලවකවානුවේ ප්‍රතිසංස්කරණය කරන ලද මස්ජිද් දෙකක් නම් කරන්න.

(vii) අකීදාවෙහි පිරිසිදු භාවය ආරක්ෂා කිරීමට දායක වූ ඉමාම්වරුන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) සන්නිවේදන මාධ්‍යයන් සතු තිබිය යුතු යහපත් ගතිලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ix) දෙමාපියන් තමන්ගේ දරුවන්ට කළයුතු යුතුකම් දෙකක් සඳහන් කරන්න.

(x) ඉස්ලාම් තහනම් කර ඇති ඉපැයීම් ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02 (i) වැරදි අකීදා පිළිපදින කණ්ඩායම් හතරක් නම් කරන්න.

(ii) කුෆ්ර් ඇතිවන ක්‍රම නිදසුන් සමග සඳහන් කරන්න.

(iii) කලා කද්ර් නම් අරාබි වචනයෙහි භාෂාමය අර්ථය සඳහන් කර, කලා කද්ර් විශ්වාස කිරීම මගින් ලැබෙන ප්‍රයෝජන හතරක් ද සඳහන් කරන්න. (ලකුණු $2+3+5=10$)

03 (i) සලාතය මගින් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(ii) ඉස්ලාමීය සිද්ධස්ථාන තුන හා ඒවා පිහිටා ඇති ස්ථාන ද නම් කරන්න.

(iii) හජ්හි වාජිබයන් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

04 (i) මහා පව් හතෙන් හතරක් සඳහන් කරන්න.

(ii) ඉවසන අවස්ථා තුනක් හා එම අවස්ථාවේ දී ඉවසාගත යුතු ආකාර තුනක් ද සඳහන් කරන්න.

(iii) ඉපැයීම හා සම්බන්ධව ඉස්ලාමීය මඟපෙන්වීම් පැහැදිලි කරන්න. (ලකුණු $2+3+5=10$)

05 (i) අස්සිහාස් සිත්තා නම් පිරිසිදු ග්‍රන්ථ හයෙන් හතරක් සඳහන් කරන්න.

(ii) රසූල්වරුන්ට හිමි වූ ප්‍රාතිහාර්යයන් තුනක් සඳහන් කරන්න.

(iii) සහභාවරු හා තාබිඊන්වරුන් සුන්නාහ්ව ආරක්ෂා කිරීමට ක්‍රියා කළ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

06 (i) මුජ්තහිද්වරුන් සතුව තිබිය යුතු සුදුසුකම් දෙකක් සඳහන් කරන්න.

(ii) ඉස්ලාමීය ෂරිආවේ දැක්මෙන් විවාහයේ අරමුණු තුනක් සඳහන් කරන්න.

(iii) අබූබක්කර් (රලි) තුමා තමන්ගේ පාලන කාලය තුළ ඉටුකළ සේවාවන් පහක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $2+3+5=10$)

07 පහත සඳහන් ඒවායින් දෙකක් තෝරාගෙන කෙටියෙන් විස්තර කරන්න.

(i) සකාත්හි වැදගත්කම

(ii) සව්මයෙන් ලැබෙන ප්‍රයෝජනයන්

(iii) ෆික්හු කලාව

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දියුණුවට මුස්ලිම්වරුන්ගේ දායකත්වය (ලකුණු $5+5=10$)

## පිළිතුරු පත්‍රය - I

01 - ( 4 ) 02 - ( 2 ) 03 - ( 3 ) 04 - ( 1 ) 05 - ( 2 ) 06 - ( 1 ) 07 - ( 3 ) 08 - ( 4 ) 09 - ( 2 ) 10 - ( 3 )

11 - ( 1 ) 12 - ( 4 ) 13 - ( 3 ) 14 - ( 2 ) 15 - ( 1 ) 16 - ( 4 ) 17 - ( 1 ) 18 - ( 3 ) 19 - ( 4 ) 20 - ( 2 )

21 - ( 3 ) 22 - ( 2 ) 23 - ( 4 ) 24 - ( 4 ) 25 - ( 2 ) 26 - ( 3 ) 27 - ( 1 ) 28 - ( 4 ) 29 - ( 4 ) 30 - ( 1 )

31 - ( 4 ) 32 - ( 1 ) 33 - ( 3 ) 34 - ( 4 ) 35 - ( 2 ) 36 - ( 4 ) 37 - ( 1 ) 38 - ( 3 ) 39 - ( 4 ) 40 - ( 3 )

(1 x 10 = 40)

## II පත්‍රය

(01) (i) නියියත් තැබීම / සුදුස්සන්ට ලබාදීම

(ii) දජ්ජාල් පැමිණීම / යඃජුජ් මඃජුජ් පැමිණීම / දාබ්බතුල් අර්ල්....

(iii) අස්සබ්ර් / තවක්කුල් / මඃරිෆ / රිළා / ඉඛ්ලාස් / තඛ්බා .....

(iv) ඉමාම් ෂාෆිර් (රහි) / ඉමාම් අබූයුසුෆ්

(v) වෙළඳ භාණ්ඩ / ආරක්ෂක පහසුකම් / ආහාර / පානීය ජලය

(vi) මස්ජිදුල් හරම් / මස්ජදුන් නබවි

(vii) ඉමාම් අහ්මද් බින් හන්බල් (රහ්) / ඉමාම් අබූමන්සූර් අල්මාතුරුදි (රහ්) / ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි (රහ්) / ඉමාම් අබූජඃෆර් අත්තහවි (රහ්)

(viii) තහවුරු වී තිබීම / විශ්වාසවන්තභාවය / මධ්‍යස්ථභාවය / සදාචාරාය රැකීම

(ix) ආදරයෙන් කටයුතු කිරීම / යහපත් අධ්‍යාපනයක් ලබාදීම / යහපත් ගතිලක්ෂණ ඉගැන්වීම

(x) පොලිය / සඟවා තැබීම / ව්‍යාජ දිවුරුම / රැවටීම

02 (i) කවාරිජ් / කදරියියා / ජබරියියා / මුඃතයිලා / මුර්ජියා

(ii) 1. විශ්වාස හා සම්බන්ධ - අල්ලාහ් විශ්වාස නොකිරීම

2. වචන හා සම්බන්ධ - අල්ලාහ්ට බැණ වැදීම

3. ක්‍රියා හා සම්බන්ධ - අල්කුර්ආනය ඉරාදැමීම, පිළිම වන්දනා

(iii) කලා - මැවීම, විසඳීම, ඉෂ්ඨ කිරීම

කද්ර් - ස්ථිර නිගමණය, පෙර මිනුම, ප්‍රමාණය

<u>ප්‍රයෝජනයන්</u>

* මුඃමින්වරයෙකු සැමවිටම තෘප්තිමත් මනසකින් සිටිති.
* ඉවසිලිවන්තයෙකු සේ කටයුතු කරයි.
* අල්ලාහ්ට තුති පුදයි.
* තවදුරටත් උත්සාහ කරන්නෙකු ලෙස සිටිති. (ලකුණු 2 + 3 + 5 = 10)

03 (i) දේව භිය බැතිය ලැබීම / අල්ලාහ් සමග සමීප වීමට හැකිවීම / පහත් ක්‍රියාවන්ගෙන් ආරක්ෂාව ලැබීම

(ii) කඃබතුල්ලාහ් - මක්කාව

මජ්ජිදුල් අක්සා - පලස්තීනය

මස්ජිදුන් නබවි - මදීනාව

(iii) 1. නියමිත ස්ථානයන්හි නියියත් තැබීම

2. දුල්හජ් 10 වන දින රාත්‍රිය පසු මුස්තලිෆාවෙහි රැඳී සිටීම

3. අයියාමුත් තෂ්රීක් යන දිනවල මිනාවේ රැඳීසිටීම

4. දුල්හජ් 10 වන දින ජම්රතුල් අකබාවහිදී ගල් 7 ක් විසිකිරීම

5. තවාෆුල් විදා ඉටුකිරීම (ලකුණු 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - II ඉතිරි කොටස

04 (i) අල්ලාහ්ට සමාන කිරීම / හූනියම් කිරීම / මිනි මැරීම / පොලිය / සටනකදී පලායෑම / අනාතයන්ගේ දේපල අනුභව කිරීම

(ii)

| ඉවසීමේ අවස්ථා | ඉවසා ගතයුතු ආකාරය |
|---|---|
| තරහ ඇතිවන විට | යටපත් කර ගැනීම |
| කෑදරකම ඇතිවූ විට | සෑහීමට පත්වීම |
| පරීක්ෂණවලදී | දරාගැනීම |
| පාප ක්‍රියා කෙරෙහි සිත ඇදීයන විට | වැළකී සිටීම |

(iii)
* ඉපැයීම ඉස්ලාම් දහම මගපෙන්වන එක් අංගයකි.
* මිනිසාගේ ආර්ථික අවශ්‍යතා සපුරාගැනීම මගින් අධ්‍යාත්මික අවශ්‍යතා ද සපුරා ගත හැකිවේ.
* සලාතය නිම කළ පසු (මස්ජිදයෙන් පිටවී) ගොස් මහ පොළොවේ විසිර අල්ලාහ්ගේ වරප්‍රසාදයෙන් සොයනු....'' (අල්කුර්ආන්)
* ''වෙළෙන්දනි! බොරුව සම්බන්ධයෙන් ඔබට අවවාද කරමි'' යනුවෙන් නබි (සල්) තුමා පවසයි.
* ව්‍යාපාර කිරීමේ දී අවංකව හා ශිලාචාරව ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

05 (i) සහින් බුහාරි, සහිහ් මුස්ලිම්, ජාමිඋත් තිර්මිදි, සුනන් අබූ දාවුද්, සුනන් නසාඊ, සුනන් ඉබ්නු මාජාහ්

(ii)
1. සාලිහ් (අලෛ) තුමා කළුගල් පර්වතයකින් ඔටුවෙකු පිටකිරීම
2. මූසා (අලෛ) තුමා සැරයටිය සර්පයකුගේ රූපය ගැනීම
3. නබි මුහම්මද් (සල්) තුමා අල්කුර්ආනය පිරිනැමීම
4. ඊසා (අලෛ) තුමා රෝගීන් පිරිමදිමින් සුව කිරීම

(iii)
* සහාබාවරු හදීස් ක්ෂේත්‍රය සඳහාම පුහුණුව ලබා සිටීම
* හදීස් ඉගෙනීම සහ ඉගැන්වීම් ක්‍රියාවල නිරත වීම
* අස්සාබුස් සුෆ්ෆාවරුන්ගේ දායකත්වය
* හදීස් ආරක්ෂා කිරීමේ ප්‍රයත්නය කලීෆා උමර් ඉබ්නුල් අසීස් (රහ්) තුමාගේ කාලයේ ආරම්භ කිරීම
* ඉමාම් ෂිහාබුදීන් සුහ්රි තුමා හදීස් එක් රැස් කළෝය.
* ඉස්ලාම් රාජ්‍ය අගනුවරවලදී හදීස් උපදෙස් පාඨමාලා පවත්වනු ලැබිණි.
* හදීස් සම්පාදනය ආරම්භ විය. උදා- ඉමාම් මාලික් (රහ්) - මුවත්තා ඉමාම් අහ්මද් (රහ්) - මුස්නද් ග්‍රන්ථය

(මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.) (ලකුණු 2 + 3 + 5 = 10)

06 (i) මුස්ලිම්වරයකු වීම, තියුණු දැනුමක් ඇත්වුන් ලෙස සිටීම, අරාබි භාෂාවේ නිපුණත්වය, අල්කුර්ආන්, සුන්නා පිළිබඳ ගැඹුරු දැනුම

(ii) සාලිහ්වූ පරම්පරාව බිහි කිරීම, කායික හා මානසික ශක්තිය ඇතිකිරීම, හොඳ සමාජ ක්‍රමය ඇතිකිරීම

(iii)
1. කිලාහකය බාරගෙන යහ පාලනයක් පැවැත්වීම
2. ව්‍යාජ නබිවරුන්ට විරුද්ධව මර්ධනය කිරීම
3. සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසට එරෙහිව කටයුතු කිරීම
4. අල්කුර්ආනය ගොනුකොට ග්‍රන්ථාරූඪ කිරීම
5. තමාගෙන් පසු සුදුසු අයකු කලීෆා ලෙස පත්කිරීම

(මෙයින් කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.) (ලකුණු 2 + 3 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - II ඉතිරි කොටස

07 (i)
* සකාත්හි වැදගත්කම
* අල්කුර්ආන්, අල්හදීස් ඉදිරිපත් කිරීම
* පැහැදිලි කර ලියා ඇත්නම් කරුණු 5 ට ලකුණු 5 ක් ලබාදෙන්න.

(ii)
* සව්මයෙන් ලැබෙන ප්‍රයෝජන
* අධ්‍යාත්මික දියුණුව ලැබීම
* ස්වර්ගය විවෘත කිරීම, නිරය වසා දැමීම
* දායාද හඳුනා ගැනීමට හැකිවීම
* දුගීන්ගේ දුෂ්කරතා හඳුනාගැනීමට හැකිවීම
* ස්වර්ගයේ විශේෂිත දොරටුවෙන් (රයියාත්) ස්වර්ගයට පිහිටවීමට හැකිවීම
* ශාරීරික නිරෝගීබව හිමිවීම

(මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

(iii) <u>ෆික්හ් කලාව</u>
* ෆික්හ් පැහැදිලි කිරීම, අල්කුර්ආන්, සුන්නා, ඉජතිහාද් මගින් ලබාගත් නීති අන්තර්ගත වේ.
* තනි කලාවක් ලෙස තාබිර-ත්වරුන්ගේ කාලයේ දියුණු විය
* මෙම කාලවකවානුවල ෆික්හ් පන්ති ප්‍රධාන නගරවල පැවැත්විණි
* ෆික්හ් කලාවේ ස්වර්ණමය යුගය ලෙස කබඋත් තාබිඋන්වරුන්ගේ කාලය හැඳින්වේ.
* ෆික්හ් කලාවේ ඉමාම්වරුන් ලෙස, ඉමාම් අබුහනීෆා (රහ්), ඉමාම් මාලික්, ඉමාම් ෂාෆිඊ (රහ්), ඉමාම් අහ්මද් (රහ්) අය සඳහන් කළ හැකිය. (මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම්)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ දියුණුවට මුස්ලිම්වරුන්ගේ දායකත්වය
* අපනයන භාණ්ඩ විදෙස් රටවල්වලට අපනයනය කර විදේශ විනිමය උපයා ගැනීම
* රටේ ගොවිතැන නගාසිටුවීමට වෙහෙස වීම
* විදේශ රටවල්වලින් පේෂ කාර්මිකයන් කැඳවා පේෂ කර්මාන්තය වර්ධනය කළහ
* රජවරුන්ගේ කාලයේ ව්‍යාපාර උපදේශකවරුන් ලෙස කටයුතු කිරීම
* නිදහස් ව්‍යාපාර ජය ගැනීමට මුස්ලිම්වරු නොමඳ දායකත්වයක් දැක්වූහ

(මෙවැනි කරුණු 5 ක් ලියා ඇත්නම්) (ලකුණු 5 + 5 = 10)

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍ර සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**
**Learn Ordinary Level**

LOL.lk online Book Store

LOL.lk

අමතන්න - 071 777 4440/0756999990/071 8540371




Online shopping

**www.lol.lk**
**Learn Ordinary Level**

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්














## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




**වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට**

# www.lol.lk

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත්

# ගෙදරටම ගෙන්ව ගන්න

# ඔන්ලයින් ඔඩර් කරන්න

# WWW.LOL.LK

# වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal VISA MasterCard DISCOVER

NO PAYPAL ACCOUNT NEEDED!

# ONLINE BOOK STORE

An evening of fun for young readers